# <u>මහාචාර්ය අජන්ත ධර්මසිරි</u>

*BSc.Eng. (Moratuwa), C.Eng. MBA (PIM -SJP), Ph.D.(PIM -SJP), FCIPM (SL),FCMI (UK)*
director@pim.sjp.ac.lk, www.pim.sjp.ac.lk, www.ajanthadharmasiri.info,
+94 777766687 (ජංගම), +94 112689644 (සෘජු)



මහාචාර්ය අජන්ත ධර්මසිරි, මානව සම්පත් ක්ෂේත්‍රයේ වෘත්තිකයකුට ජීවිතයේ එක් වරක් පමණක් පිරිනැමෙන IPM ස්වර්ණ සම්මානයෙන් 2014 දී පුද ලැබීය. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත, පශ්චාත් උපාධි කළමණාකරණ ආයතනයේ (PIM) අධ්‍යක්ෂක සහ කළමණාකරණ මණ්ඩල සභාපති ලෙස සේවය කරයි. ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ, ඔක්ලහෝමා සරසවියට අනුබද්ධිත ප්‍රයිස් ව්‍යාපාරික පීඨයේ ජාත්‍යන්තර මානව සම්පත් කළමණාකරණය පිළිබඳ බාහිර මහාචාර්යවරයෙකු ලෙසද කටයුතු කරයි. ශ්‍රී ලංකා වරලත් පිරිස් කළමණාකරණ ආයතනයේ (CIPM) සභාපති ලෙසද කටයුතු කළ ඒ මහතා ආසියා පැසිෆික් මානව සම්පත් කළමාණාකරණ සංසදයේ(APFHRM) උපසභාපති වරයෙක් ලෙස ද පත්විය.

මහාචාර්ය ධර්මසිරි දශක තුනකට ආසන්න කාලයක් යුනිලීවර් සහ නෙස්ලේ ආයතන ඇතුළුව පෞද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයෙහිම සේවය කර ඇත. ඒ මහතා ලොව පුරා රටවල් විස්සකට වැඩි ගනනක දේශන, පුහුණු හා උපදේශන ව්‍යාපෘති පවත්වා තිබේ.

ධර්මසිරි මහතා මොරටුව විශ්වවිද්‍යාලයෙන් විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය ලබා ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමණාකරණ ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ එම්.බී.ඒ සහ ආචාර්ය උපාධියද ලබා ගෙන තිබේ. මහාචාර්ය ධර්මසිරි, වරලත් විදුලි ඉංජිනේරුවකු හා එක්සත් රාජධානියේ වරලත් කළමණාකරණ ආයතනයේ සාමාජිකයකු ද වේ. CDB, NIBM, Softlogic, DSI වැනි ආයතන වල ස්වාධීන අධ්‍යක්ෂකවරයකු ලෙසද ඒ මහතා කටයුතු කරයි.

පර්යේෂකයකු ලෙස හා අධ්‍යයන විශේෂඥයෙකු ලෙස විවිධ පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර ඇති ඒ මහතා ලංකාවේ පැරණිම කළමණාකරණ පර්යේෂණ සඟරාව වන SLJM හි කතුවරයා ද වේ. මහාචාර්ය අජන්ත දැනට ග්‍රන්ථ සතක් රචනා කරැති අතර විද්‍යුත් මාධ්‍යවේදියෙකු හා තීරු ලිපි රචකයෙකු ලෙසද කටයුතු කරයි.

මහාචාර්ය ධර්මසිරි තමන්ව හදුන්වාගන්නට කැමති “විදුලි ඉංජිනේරු විද්‍යාවෙන් බැහැරව හදවත හා මනස පිළිබඳ ඉංජිනේරුවකු” වන්නට පියවර තබන්නකු ලෙසය.